

# පාසල

විලද්‍යක මත්ද්‍රව්‍ය නිවාරණ
පාසල් වැඩසටහන් සඳහා මගපෙන්වීමකි.

මහාචාර්ය දියනාත් සමරසිංහ විසින්
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
සඳහා සම්පාදනය කරන ලදි.

---

දෙවන මුද්‍රණය 2016 මැයි

දෙවන මුද්‍රණයේ පරිගණක නිර්මාණය හා පිටු සැකැස්ම මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ අනුග්‍රහයෙනි.



# පාසල

සමහර පාසල්වල රසවත් කටයුතු දැන් කෙරෙනවා. සිගරට්, ගංජා, හෙරොයින් හා මද්‍යසාර වැනි ද්‍රව්‍ය වැළැක්වීමේ වැඩත් මේවාට ඇතුළත්. සාර්ථක ප්‍රතිඵල ලැබෙන්නේත් වඩා ලිහිල් හා රසවත් වැඩවලින් බවයි පෙනෙන්නේ.

වැඩක් කිරීමේදී ප්‍රතිඵල බැලීම වැදගත්. මේ පත්‍රිකාවේ ඇත්තේ එබඳු ලබා ඇති සහ ලැබිය හැකි ප්‍රතිඵලවල උදාහරණ. අපටත් යා හැකි දිසාවක් ඒවායින් පැහැදිලි වෙනවා. අනෙක මේ ආකාරයේ ප්‍රතිඵල ළඟාවෙනවාදැයි වැඩි කලක් නොගොස් බලන්නත් පුළුවන්.

හොඳ අරමුණින් පමණක් වැඩ කිරීම මදි. අරමුණු ඉටු කිරීමට අදාළ නිවැරදි අවබෝධයත් අවශ්‍යයි. අවබෝධය නැතිව කෙරෙන වැඩවලින් බලාපොරොත්තු ප්‍රතිඵලයට විරුද්ධ එක ලැබෙන්නත් පුළුවන්. අවබෝධය සහ යහපත් අරමුණු තිබීමත් මදි. වැඩ කෙරීයන අතර නිරතුරුව ඒවායින් ඇතිවන බලපෑම තක්සේරු කළ යුතුයි.

දැනටමත් පාසල් ගුරුවරු ගුරුවරුවරියන් විසින් දැක ඇති ප්‍රතිඵල පහත සඳහන් ලැයිස්තුවේ අඩංගුයි. එලෙසම ඒ අය බලාපොරොත්තු වන ප්‍රතිඵලත් ඇතුළත්. මේ ප්‍රතිඵල විශේෂ අනුපිළිවෙලකට සටහන් කර නැහැ. සිසුන් තුළ, පාසල තුළ, ගුරු මණ්ඩලය තුළ සහ බාහිර ප්‍රජාව තුළ ඇතිවිය හැකි වෙනස්කම් මෙම ලැයිස්තුවෙන් පැහැදිලි වෙනවා.

සිගරට්, ගංජා, මද්‍යසාර හෝ හෙරොයින් භාවිතය අඩු කරවීමට අපත් වැඩ කරන්නේ නම් මේ ලක්ෂණ අපේ වැඩවල දර්ශක ලෙසත් යොදා ගන්න පිළිවන්.

# ළමයින්ගේ වෙනස්වන ගුණාංග



- සිගරට් හෝ ගංජා බොන අයෙක් දැක්කහම ඉබේම හිනහා යනවා. උජාරුවට බොන අය සොයනවා, ඔවුන් හාස්‍යයට ලක් කර රස විඳින්න.
- පංතියේ ළමුන් නැරඹූ චිත්‍රපට, ටෙලිනාට්‍ය හා අනෙකුත් වැඩසටහන්, පුවත්පත් සහ සඟරා මගින් මෙම ද්‍රව්‍ය අලංකාර කරවන උපක්‍රම අනිත් අය එක්ක කියනවා.
- අවබෝධය හෝ බුද්ධිය අඩු ළමුන් වුව ද මෙම ද්‍රව්‍ය අලංකාර කරවන උපක්‍රම වලට (උදා: හින්දි චිත්‍රපට, ටෙලි නාට්‍ය, චිත්‍ර කතා, සඟරාවලින් මේවා ලස්සන හෝ අපූරු ලෙස පෙන්වන කොටස් අඩංගු කරවීමෙන්) නොරැවටීමට උදව් කරනවා.
- ගංජා බොන, ගුලි කන, අරක්කු බොන එකට අදාල නමක් කියනවා.
- මේවා  භාවිතය ගැන බොරු වර්ණනා කියන්න හෝ පුම්බන්න ආවහම ඒ අයව හිනහවට ලක් කරනවා.
- හෙරොයින්, ගංජා, සිගරට්, මද්‍යසාර ප්‍රචලිත කරවන වැඩ ගැන තොරතුරු එකතු කරන ක්‍රමයක් යොදනවා. එම බලපෑම්වලට එරෙහි ව්‍යාපාර ක්‍රියාත්මක කරනවා.
- සිගරට් බෝඩ් තියෙන හෝ සිගරට් පොවන කඩවලට නමක් තියෙනවා. (පට බැඳීමක්) අමතනවා.
- ළමුන් රවටා ගැනීමට පාවිච්චි කරන ක්‍රම ගැන අවබෝධ කරවන නාට්‍ය හදනවා.
- මාධ්‍ය මගින් සහ විවිධ විනෝද ප්‍රසංග හා සංදර්ශනවලට මේ ද්‍රව්‍ය ද අමුණා ළමුන් අන්දවන්න කරන නොයෙකුත් අලුත් වැඩ ගැන සොයනවා, ඒවා නිවැරදි කරන්න අමතනවා. ( දුරකතනයෙන්, ලිපි වලින්, හමුවීම් මගින් සහ අන් අය සමගින්)
- ආදි ශිෂ්‍ය හමු, වෙනත් විශේෂ අවස්ථා ආදියේ මද්‍යසාර හෝ සිගරට්  භාවිතා කරන විලාසයෙන් හා වෙනත් ආකාරයෙන් මේවා ප්‍රචලිත කරවන්නත්, විමසිල්ලෙන් නිරීක්ෂණය කරනවා. ප්‍රශ්න කරනවා. භාවිතා කරන වැඩිදෙනෙක්ම ආයාසයෙන් නිරූපණය කරන රසය අභියෝගයට ලක් කරනවා.

- අදාල කොම්පැනිවලට, ප්‍රචාරක ආයතනවලට, මාධ්‍ය ආයතනවලට බැඳී ඒවායින් මේ ද්‍රව්‍ය ප්‍රබලව ප්‍රවර්ධන හා ප්‍රචාරය කරන පුද්ගලයින් හඳුනාගන්නවා. ඒ අයගේ ක්‍රම හඳුනා ගන්නවා. ඒ අය නිවැරදි කරනවා.

- අවට 'රට බීම', 'සීල්', හෙරොයින්, කසිප්පු, බියර් සහ සිගරට් අලෙවි කරන ස්ථානවල අයට හැමදාම කවුරුහරි කොලොප්පමක් කරනවා.

  උදා :

  - 'සිංහයෝ ඉන්නවා ඇති මෙතන නම් '
  - 'මූණෙන්ම පෙනෙනවා විනෝදයයි රසයයි'
  - 'අපිටත් ටිකක් පෙව්වොත් මෙතනම ඉබේම නැටවෙයි නේද ?'
  - 'මටත් ප්‍රශ්න ටිකක් තියෙනවා - ඕවා බීපු ගමන් අමතක වෙලා යනවලු නේද ?'
  - 'අන්න නියම සිංහයෝ - බැලුව ගමන් දැනෙනවා තේජස'
  - 'සීතලට හොඳයිලු නේද, මේ මහ රස්නේ උනත් මෙහෙටත් සැපයිලු'
  - 'විභාගේ ඉවරඋනාම සැප දැනෙන්නේ මේවා බිව්වමලු නේද ? - ඇයි දන්නේ නෑ විභාගය ඉස්සෙල්ලා බිව්වම සැප දැනෙන්නේ නැත්තේ '

- 'බිග් මැච්', 'විශේෂ උත්සව' විභාග ඉවරවන දින ආදියේදී කොහොමත් දැනෙන රසය හා නිදහස මෙම ද්‍රව්‍ය ලස්සන හා රසවත් කරවන්න පාවිච්චි වන ආකාරය දකිනවා අවබෝධය අඩු ළමුන්ටත් දකින්න සලස්වනවා.

- පන්තියේ ඉන්න අවබෝධය අඩුම යාළුවා උනත් හසුකර ගන්න මෙම ව්‍යාපාරවලට ඉඩ තියන්නේ නැහැ.

- තමන් භාවිතා කළොත්, අනුන්ට බයේ බොරු වර්ණනා නොකියා තමන්ගේ ඇත්ත අත්දැකීම කියන්න ශක්තිය තියෙනවා.

# ගුරු මණ්ඩලයේ ඇතිවන වෙනස්කම්



- ගුරු මණ්ඩලයේ සමහර අය මෙම ද්‍රව්‍ය රසවත් හෝ අපූරු කරවන ප්‍රකාශ කියන විට, අනෙක් අයට ඒ අය ගැන හිනහා යනවා.

- ගුරු මණ්ඩල චාරිකා ආදියේදී මද්‍යසාර හා අනෙකුත් ද්‍රව්‍ය රසවත් කරන්න ගන්නා උත්සාහයන් නිවැරදිව දකිනවා. අමාරුවෙන් බොමින් රසවත් සේ පෙන්වන අයද හඳුනාගන්නවා.

- මෙම ද්‍රව්‍ය සහ ඒවා භාවිතය පුම්බන වචන වෙනුවට ඒවා අවඥාවට ලක් කරන වචන පාවිච්චි කරන්න පටන් ගන්නවා.

- දුම්කොළ, මද්‍යසාර කොම්පැණිවලට බැඳී වුවද ඒවා ඇතුළතින් වෙනස් කරන්න පුළුවන් ක්‍රම අදාල අයට උගන්වනවා.

- මේවා ප්‍රචාරයට යොදාගන්නා, වෙළඳ පර්යේෂණ ආයතන, මාධ්‍ය ආයතන සහ ප්‍රචාරක උපකම සොයා එළි කිරීමේ ක්‍රම ළමුන්ට උගන්වනවා. තමන් කරනවා. එම ආයතනත් අමතනවා.

- ගුරු විවේකාගාරය තුළ සිගරට් භාවිතය නවතිනවා. භාවිතා කරන අයත් තම භාවිතය ගැන අවංකව ලැජ්ජාවෙන් පසුවෙනවා.

- මෙම ද්‍රව්‍ය භාවිතයට ඇළුම් කරන අයට ද්‍රව්‍ය නොමැති සෑම අවස්ථාවකම අඩු නිදහසකින්, අඩු ප්‍රබෝධයකින් හා නොරිස්සුමෙන් ජීවත්වෙන්න සිදුවීම, ළමුන්ට ප්‍රායෝගික උදාහරණ තුලින් පෙන්වාදෙනවා.

# පාසල් අවට පරිසරයේ පෙනෙන වෙනස්කම්



- පාසල් අවට පරිසරයේ සිගරට් කොට එන්න එන්නම අඩු වෙනවා.
- අවට වෙළඳසැල්වල අයට දුම්කොළ කර්මාන්තයෙන් බඩු ගෙනෙන අයට අමතන්න ව්‍යාපාරය අයහපත් බව වැටහෙන ස්වරයෙන්.

  උදා :

  'ආ කමක් නෑ දීලා යන්නකෝ සිගරට් ඒත් මේවා අලෙවිය අඩු උනොත් නේද මහත්තයෝ හොඳ ' කියලා හෝ 'ඉක්මනට දීලා යන්න. ළමයින් දැක්කොත් මට ලැජ්ජයි ' කියලා හෝ 'අළුත් පින්තූර ටිකක් දෙන්න මහත්තයෝ, මේ ළමයින් මේවයි ලියන ඒවා බලන්නකෝ... කියා' හෝ'මහත්තයලා දැන් ප්‍රචාරය නවත්තලා කිව්වාට මේ වෙනත් ක්‍රමවලින් පර්යේෂණ කියලා එහෙම බෙදා දෙන එක හරි නෑ නේද ?'

- අවට 'රට බීම', 'සීල්', හෙරොයින්, කසිප්පු, බියර් වෙළඳසැල්වල අලෙවිය අඩු වෙනවා.
- මද්‍යසාර බීපු අය පාසල පසුකරගෙන යන්නෙත්, අවට ගැවසෙන්නෙත් 'වෙරි' බව සඟවා ගෙන.
- පාසල තුළ සාමාන්‍යයෙන් සිගරට් කොට නැහැ. ඉඳහිට එකක් තිබුණොත් 'මෝඩයා සෙවීමේ' තරගයක් ඇරඹෙනවා.
- කැන්ටිමේ අය, ආරක්ෂක අය, වාහන පාක් එකේ අය අතර දැන් මේවා භාවිතය අඩු වෙනවා.
- පාසල ගැන වැඩි දෙනෙක් කතා කරන්නේ සතුටින් සිනහා වී, ළමුන්ගේ වැඩ හා රස විඳීම ගැන රසවත්ව.

- අවට මද්‍යසාර භාවිතා කරන තැන්වල ජනතාව අඩු වෙනවා. භාවිතා කරන විලාශයේ පම්පෝරි අඩුවෙනවා.

- මද්‍යසාරවලට ලැදි අය ඉස්කෝලේ මේ වැඩ තදින් විවේචනය කරනවා. පුවත්පත් වලටද ලියා බනිනවා.

- ගංජා, හෙරොයින් භාවිතයේ ඉන්නා අය තම භාවිතය ගැන මේ පාසලේ ඉන්න සිසුන්ට කියන්න ලැජ්ජයි. බොරු වර්ණනාවලට ඔවුන් හසුවෙන්නේ නැති බව දකිනවා.

- දුම්කොළ කොම්පැණියේ හා විවිධ සිගරට් හා මද්‍යසාර වර්ගවල ලාංඡන සහිත මෝටර් වාහන, බයිසිකල් ආදිය මේ පාසල පැත්තෙන් යන්නේ නැහැ.

- පාසලේ සිට එන්න එන්නම විශාල වන ප්‍රදේශයක මද්‍යසාර, දුම්වැටි ආදී දෑ සඳහා ප්‍රසිද්ධ වෙළඳ දැන්වීම් හා අලෙවි ස්ථාන අඩු වී යනවා.

- ටෙලි නාට්‍ය, සංගීත සංදර්ශන, ක්‍රීඩා විකාශයන්, චිත්‍ර කතා සහ පුවත්පත් ලිපි ආදිය මගින් හෙරොයින, සිගරට්, මද්‍යසාර, ගංජා හා අනෙකුත් එබඳු ද්‍රව්‍ය ප්‍රචාරය කරන්න හදන අය මෙම පාසල නමින්ම හඳුනනවා (පාසලෙන් නිරතුරුවම ඔවුන් ඇමතෙන නිසා)

- සිගරට්, මද්‍යසාර වර්ගවල නම් හා ලාංඡන සහිත ඇඳුම්, තොප්පි ආදිය පළඳි නඅය ඒවා නිවැරදි කරලා මිස පාසල ළඟින් පැළඳගෙන යන්නේ නැහැ.

- ළඟ තියෙන කඩ සාප්පු තුළ මේ ද්‍රව්‍ය ප්‍රචාරය කරන දැන්වීම ඇත්නම් ඒවා ප්‍රකෘති වෙනවා.

- ගංජා, සිගරට්, මද්‍යසාර බීලා එන අයට ළමයි ඉස්සරහට එන්න බයයි. ඒවා ගැන කියන්නත් බයයි.

- සිසුන්ගේ පවුල්වල අය හෝ නිවෙස් අවට අය හෙරොයින්, සිගරට්, කසිප්පු, බීර, අරක්කු, ගංජා ආදී දේ අලෙවි කරමින් සිටියා නම්, ඒවා අලෙවිය සමාජයටත් තමන්ටත් අවැඩදායී බව හඳුනා ගන්න පටන් ගන්නවා. තම අලෙවිය ගැන ලැජ්ජා වෙනවා.

- දෙමව්පිය බහුතරය දරුවන්ගේ ඇත්ත ප්‍රගතිය දැක සතුටු වෙනවා. ඒ අය ද මෙම ද්‍රව්‍ය ප්‍රචලිත කරන ව්‍යාපාර බිඳීමට සක්‍රීයව ඉදිරිපත් වෙනවා.

- අලෙවිය අඩුවීමෙන් ආදායම අඩුවන විට මෙම ව්‍යාපාරිකයෝ පාසලේ මෙම රැල්ල කැඩීමට ගන්නා වක්‍ර උපක්‍රම දෙමව්පියන් හඳුනනවා. ඒවාට හසුවන්නේ නැහැ. ඉඩදෙන්නේ නැහැ.

- දේශපාලඥයින් ද මෙම ද්‍රව්‍ය ප්‍රචලිත කිරීමට රුකුල් දෙන විට පාසලෙන් ඊට එරෙහි ඇමතුම් ලැබෙනවා.

# විග්‍රහය



ඉහත සඳහන් ලක්ෂණ අහඹු ලැයිස්තුවක් පමණයි. එහෙත් ඒවායින් දැනෙන පොදු දිශාවක් තිබෙනවා. මෙම දිශාවට පාසල යනවිට ඇතිවන වෙනස්කම් තේමා කිහිපයකට සාරාංශ කළ හැක ඒවා පහත දැක්වේ.

- මෙම ද්‍රව්‍ය ප්‍රචලිත කරවන විධිමත් හා අවිධිමත් ක්‍රම පිළිබඳව දුර්වලම ළමයා දක්වා අවබෝධය දියුණු වීම.
- එම ක්‍රම විරුද්ධ අතට හැරවීමට සක්‍රිය, විනෝදයට ලැදි, ළමුන්ම ක්‍රියාත්මක වීම.
- මෙම ද්‍රව්‍ය භාවිතය රසවත්, ආකර්ෂණීය හා අපූරු දෑ ලෙස නොව නීරස, දුබල හා කිසිඳු වටිනාකමකින් තොර දෑ බව ක්‍රමිකව හඳුනාගැනීම.
- ඒ සඳහා දියත් වන වැඩපිළිවෙල සමන්විත වන්නේ, ළමුන්ගේම සැහැල්ලු, විනෝද සහගත ක්‍රියාකාරකම් තුළින් වීම. අවවාදාත්මක හෝ තර්ජනාත්මක උපදෙස්වලට සීමා නොවීම.
- අදාළ ප්‍රතිඵල හෝ වෙනස්කම් වර්තමානයේ සිටම දැකගත හැකි ඒවා වීම.

අවසානයේ සඳහන් තේමාව විශේෂයෙන් වැදගත්. පාසල් ළමුන්ට ද තම ක්‍රියාකාරකම් මගින් ඇති වන ප්‍රතිඵල ගැන විමසිලිමත්වීමට උවමනාව තිබිය යුතුය. ඉහත සඳහන් ඕනෑම එක් උදාහරණයක් ගෙන මෙම ශිල්පය දියුණු කරගත හැකිය.

## සැලසුම

ප්‍රතිඵල ඇගයීමේ ශිල්පය දියුණු කිරීමේ අභ්‍යාසයක් ලෙස වුව ද ඉහත එක් එක් අංගයක් ගෙන විග්‍රහ කිරීම ප්‍රයෝජනවත් වේවි.

1. අවසානයේ දී සිදුවිය යුත්තේ කුමක් ද ?
2. ඊට ප්‍රථම සිදුවිය යුත්තේ කුමක් ද ?
3. හෙට වුව ද ඒ සඳහා ඇති කළ හැකි අල්ප මාත්‍රික වෙනස කුමක්ද ?

හෙට දිනයේම වුවද අල්ප මාත්‍රික හෝ වෙනසක් අදාල දිශාවට ඇති කරගත නොගතහොත් අවසන් ප්‍රතිඵලය ඇතිවේදැයි සෙවීම අනවශ්‍යයි. ඒ නිසා ඒ පියවර දක්වා අප සිතා තිබිය යුතුයි.

## 1. අවසානයේ දී සිදුවිය යුත්තේ කුමක් ද ?

මුලින් ලියා තිබූ ලැයිස්තුවේ මුල් ම අංගය උදාහරණයට ගනිමු. ' සිගරට්ටුවක් භාවිතා කිරීම දකින විට ළමුන්ට ඉබේම හිනහා යනවා' යන්න එහි සඳහන් අවසන් ප්‍රතිඵලයයි. ඊට ප්‍රථම සිදුවිය යුතු දේ විග්‍රහ කිරීම අප සතු මුල් වගකීම වෙනවා.

භාවිතය දැක්ක විට සහහා යාමට නම් ඊට ප්‍රථම සිදුවිය යුත්තේ කුමක් ද? මෙම කටයුත්ත මෙහෙයවන අය මෙතැන ටිකක් නැවතී සිතා බැලිය යුතුයි. එවිට අදහස් ක්‍රමයෙන් ගොඩනගා ගත හැකිය.

## 2. ඊට ප්‍රථම සිදුවිය යුත්තේ කුමක් ද ?

සිගරට්ටුවක් ඉරීම මෙතෙක් හාස්‍යයට ලක් නොවූ දෙයක් වෙන්න පුළුවන්. එය හාස්‍යජනක දෙයක් ලෙස සැවොම දකින්නට නම් කුමක්ද විය යුත්තේ ? එක් අතකින් එය කෙරුම්කාර දෙයක් ලෙස නිරූපණයවීමට හේතුවන සාධක අප හඳුනාගත යුතුය. නළු නිළියන්, වෙනත් අය විශේෂ අවස්ථා මගින් ඉබේම ගොඩනැංවෙන ලස්සන ප්‍රතිරූපය හඳුනාගැනීම එක් පියවරක්.

තවත් පියවරක් එයින් මතු වෙනවා. එනම් මෙම රැවටිලි ව්‍යාපාරයට හසුවන්නේ කවුද යන්න. පාසල් ළමුන් අතරේ පහසුවෙන්ම රැවටෙන ළමයා තමයි සිගරට්ටුව කෙරුම්කාර දෙයක් ලෙස හින්දි නළුවා නිරූපණය කරන නිසා තමන් ද පාවිච්චි කරන්නේ

මේ අවබෝධය ඇතිවූ විට ඒ ළමයාගේ භාවිතය හාස්‍යජනක දෙයක්ම වෙනවා. නොඑසේ නම් කණගාටුදායක දෙයක් බව හැඟෙනවා. දැන් අපේ විග්‍රහය එක් පියවරක් ඉදිරියට ගිහින් සිගරට්ටුවක් භාවිතය හාස්‍ය උපදවන දෙයක් වීමට නම් ඊට ප්‍රථම සිදුවිය යුත්තේ කුමක් ද ? යන්නේ එක් උදාහරණයක් දැන් ඇවිත්. එනම් තරුණයෙක් මෙය උජාරුවට භාවිතා කරන විට හින්දි නළුවා අනුකරණය කිරීමට ගන්නා උත්සාහය දැකීමයි. ඔහු වැනි අයම හසුකර ගැනීමට ක්‍රියාත්මක වන උපක්‍රම මේ තරුණයා නොදැනීම මෙහි එක් පැත්තක්. ජනප්‍රිය නළුවා වගේ පෙනෙන්නට සිගරට්ටුවෙන් පුළුවන්වෙනවා කියා ඔහු සිතීම හාස්‍යජනක මෙන්ම කණගාටු දායක තවත් පැත්තක්.

මේ විග්‍රහ කළේ එක් අංගයක් පමණයි. සිගරට්ටුව ඉරීම හාස්‍ය ජනකව පෙනීමට තවත් සාධක බොහොමයක් මේ කටයුත්තේ යෙදෙනවිට අවබෝධවේවි. සිගරට්ටුව ඉරීම හාස්‍යජනකදෙයක් ලෙස දැකීමට නම් ඊට ප්‍රථම සිදුවිය යුතු දේ කුමක් ද? යන්න මේ අයුරින් තව තව පුළුල් ව දකින්නට අපට හැකිවේවි.

හින්දි චිත්‍රපට උපක්‍රමවලට හසුවීම දැකීම මෙහි එක් අංගයක් පමණයි. හාස්‍ය උපදවීමට හේතු වන තව දේවල් ද ඇත. තමන් ගැන විශ්වාසය අඩු බව සිගරට්ටුවෙන් වසා ගැනීමට උත්සාහ ගැනීම එබඳු තව පැත්තක් විලාසිතාවක් ලෙස නිරූපණය කරන ප්‍රචාරයන්ට පමණක් අවධානය යොමු කර පාරේ තොටේ සිගරට් බොන බහුතරයගේ ස්වභාවය මේ තරුණයා නොදැකීම තවත් එකක්. මේ අයුරින් දෙවන ප්‍රශ්නයට සම්බන්ධ අදහස් අපම සිතා ගෙන යනවිට තව අදහස් වර්ධනය වේවි.

## 3. හෙට වුව ද ඒ සඳහා ඇති කළ හැකි අල්ප මාත්‍රික වෙනස කුමක්ද ?

විග්‍රහයේ තුන්වන පියවර වුයේ, හෙට වුව ද ඒ සඳහා ඇති කළ හැකි අල්පමාත්‍රික වෙනස කුමක්ද යන්නයි.

එක්වර රටක් වෙනස්වන්නේ නැත. එහෙත් එක් දවසක් තුළ පුළු හෝ යම් වෙනසක් ඇති කිරීමට පුළුවන. හෙට වුවද කළ හැක්කේ කුමක්ද ? පාසලේ ළමුන් සිගරට් භාවිතය හාස්‍යජනක දෙයක් ලෙස දැකීමට නම් ? මෙයට පිළිතුරු ලැබෙන්නේ ඉහත දෙවන ප්‍රශ්නය පිළිබඳ කළ විග්‍රහය මගිනි.

ඒ අනුව, සිගරට් උරන තරුණයා හින්දි නළුවෙකු වගේ වීමට ගන්නා අසාර්ථක උත්සාහයක යෙදීම හැමෝටම තේරුම් යන එකයි අවශ්‍ය. එසේ නම්, ඒ අවබෝධය ඇති කිරීම සඳහා හෙට වුවද කළ හැක්කේ කුමක් ද? නොඑසේ නම් අද මා?

මහ උජාරුවෙන් සිගරට් බීමට උත්සහ කරන අය දෙස මේ අවබෝධය තුළින් බැලීම එකක්.

සමහර තරුණ අය එය අද සිටම කරන්න පටන් ගන්න පුළුවන්. පාසල් ළමුන්ට පුළුවන්, ඔවුන් අතරේ හෝ කතා කරන්න. අර විදියට සිගරට්ටුවක් ප්‍රදර්ශනය කරන්න ඒ අයියාට සිදුවෙලා තියෙන්නේ ඇයි කියා සොයන්න. සිගරට්ටුවෙන් මේ අයියා අර හින්දි නළුවා වගේ වෙනවා නොව, තවත් දුබලව පෙනෙන බව තේරුම්ගන්න. අපට නම් අරයගේ දුම්බීම පෙනෙන්නේ මෙහෙමයි කියා අනිත් අයටත් කියන්න පුළුවන්.

මේ ක්‍රියාකාරකම් පටන් ගන්නේ අද සිටම. එයින් ඇතිවන ප්‍රතිඵලය විශාල එකක් නොවෙන්නට පුළුවන් එහෙත් මේ ක්‍රියාකාරකමේ යෙදෙන ළමුන්ගේ අවබෝධය හෝ එමගින් දියුණු වීමට පටන් ගන්නවා.

තමන් ගැන විශ්වාසය මදි නිසා සිගරට්ටුවක් පිටුපස සැඟවීමට බලන එක ද ඒ අයුරින්ම අද සිට හෙළිකිරීමට පුළුවන්. තරුණ වියේ සිගරට් ඉරීම ආරම්භ කරන අයගේ මේ දුර්වලතාවය පන්තියේ ළමුන්ට බලන්න සලස්වන්න පුළුවන්.

අවබෝධය දියුණුවන්නේ ක්‍රියාකාරකම්ද තුළින්, ආත්ම විශ්වාසය අඩු තරුණයා සිගරට්ටුව පිටුපස සැඟවීමට ගන්නා උත්සාහය ප්‍රායෝගිකව ද පෙන්වීමට පුළුවන්.

විශාල කෙරුම්කාරකමක් ලෙස සිගරට්ටුවක් උරන තරුණයාගෙන් යමක් ඇසීමට අපට පුළුවන් ළමුන්ටත් පුළුවන් ඔහුට යමක් කීමට බස් රියේ යන අතර අවබෝධ වන අයුරින් හෝ ඒ ගැන යමක් කිරීමට වුවත් පුළුවන් මේ අයුරින්. අද සිටම ගත හැකි පියවර ගොඩක් ඉබේම පැහැදිළි වෙනවා.

අප දකින්න ආසා මට්ටමට පාසල ගෙන ඒමට නම් මුල් කොටසේ තිබූ ගුණාංග ලැයිස්තුවේ එකිනෙක අංගය ගැන මේ අයුරින් විග්‍රහ කර ක්‍රියාත්මකවීමට පුළුවන්.

මේ සඳහා විශාල මහන්සියක් අවශ්‍ය නැහැ. අවශ්‍යවන්නේ නිදහස් නිර්මාණශීලි මනසක් සහ සක්‍රීයව ජීවත්වීමට ආසාවක් පමණයි.